සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2018

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**07 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පරිගණක පද්ධතියේ නිවැරදිව කොටස් දක්වා ඇත්තේ,

(1) ආදාන, සැකසීම, ගබඩාකිරීම (2) ආදාන, සැකසීම, ප්‍රතිදාන

(3) ප්‍රතිදාන, සැකසීම, සන්නිවේදනය (4) ගබඩා කිරීම, ප්‍රතිදානය, ආදානය

02 පරිගණකයක් යන්න දැක්වීමේ දී අදාළ නොවන පදය වන්නේ,

(1) විද්‍යුත් උපකරණයකි. (2) දත්ත තොරතුරු බවට පත්කරයි.

(3) මිනිසා විසින් නිර්මාණය කර ඇත. (4) මිලෙන් අධිකය.

03 බැංකුවක ගනුදෙනු ගණක යන්ත්‍රයකින් කරනවාට වඩා පරිගණකයකින් සිදුකිරීම වඩා සුදුසු වන්නේ,

(1) නිවැරදි බව නිසා (2) වේගවත් බව නිසා

(3) ගබඩා කිරීමට හැකි නිසා (4) ඉහත සියල්ලම නිසා

04 සංජීව දිල්ෂාන් තම පරිගණකයෙන් පරිගණක ක්‍රීඩා කරන අතර, අධ්‍යාපන DVD මගින් අධ්‍යාපනය ලබයි. එසේම ගීත ඇසීමටත්, චිත්‍ර ඇඳීමටත් කැමැත්තක් දක්වයි. මෙමගින් දැක්වෙන ලක්ෂණය වන්නේ,

(1) වැඩි මතක ධාරිතාවය (2) බුද්ධිමත් නොවීම

(3) වේගවත් බව (4) බහුකාර්ය බව

05 යතුරු පුවරුව (Key Board) යනු ......................... උපාංගයකි.

(1) දත්ත ඇතුළත් කරන (2) දත්ත සකසන

(3) දත්ත ප්‍රතිදානය කරන (4) දත්ත ගබඩා කරන

06 පහත සඳහන් දත්ත ගබඩා කරන උපාංග අතරින් අඩුම මතක ධාරිතාවයක් ඇත්තේ කුමකට ද?

(1) DVD (2) CD (3) දෘඪ තැටිය (4) Pen Drive

07 පරිගණකයේ ඇති භෞතිකමය කොටස් හඳුන්වන්නේ,

(1) පරිගණක උපාංග (2) පරිගණක පරිශීලක

(3) පරිගණක මෘදුකාංග (4) පරිගණක දෘඪාංග

08 සන්සි විසින් පරිගණක මෘදුකාංග භාවිතයෙන් සිදුකරන විවිධ නිර්මාණ ගබඩා කිරීමට වඩා සුදුසු වන්නේ,

(1) Folder තුළ (2) පරිගණක තිරය Desktop තුළ

(3) දෘඪ තැටිය තුළ (4) CD තැටි තුළ

09 පහත උපාංග අතරින් පරිගණක තොරතුරු ප්‍රතිදානය කරන උපාංගය වන්නේ,

(1) මුද්‍රණ යන්ත්‍රය (2) පරිගණක තිරය (3) ස්පීකරය (4) ඉහත සියල්ලම

10 පහත වැඩසටහන් අතරින් මෘදුකාංගයක් නොවන්නේ කුමක් ද?

(1) Paint (2) පරිගණක ක්‍රීඩා (3) Word (4) Folder Icon

- අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශයන් නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

11 UP මගින් පරිගණකයට විදුලිය පාලනයකින් යුතුව ලබාදේ. ( )

12 පරිගණකයක වේගය වැඩිවීමට RAM මතකය වැදගත්වේ. ( )

13 අන්තර් ජාලයෙන් ඡායාරූප පමණක් ලබාගත හැකිය. ( )

14 (e-mail) ඊ-මේල් මගින් තොරතුරු සන්නිවේදනය සිදුකළ හැකිය. ( )

15 පරිගණක විද්‍යාගාරයට ඇතුළුවන විට පාවහන් ගළවා ඇතුල්වීම මගින් දූවිලි ඇතුල්වීම අවම කරගත හැකිය. ( )

- අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට වරහන් තුළ ඇති පිළිතුරුවලින් ගැලපෙන පිළිතුර තෝරා ලියන්න.

( Paint / MS-Word / Windows 8 / Android / පරිගණක ක්‍රීඩා )

16 පරිගණකයේ ඇති මෙහෙයුම් පද්ධති වර්ගයකි ..............................

17 චිත්‍රක මෘදුකාංගයකි ..............................

18 පරිගණකයෙන් විනෝදයට භාවිතා කළ හැකි අවස්ථාවකි ..............................

19 ලිපි ලේඛන භාවිතා කිරීමේ දී යොදාගැනෙන වැඩසටහනකි ..............................

20 ජංගම දුරකථනවල භාවිතා වන මෙහෙයුම් පද්ධතියකි ..............................

- ප්‍රශ්න අංක 21 සිට 25 ක්වා **A** හා **B** තීර යා කරන්න.

| | A | | B |
|---|---|---|---|
| 21 | මධ්‍යම සැකසුම් ඒකකය | (a) | Left button, Right button (වම්, දකුණු බොත්තම්) |
| 22 | පරිගණක පද්ධති කාර්යයන් | (b) | CD, DVD |
| 23 | යතුරු පුවරුවේ යතුරු වර්ග | (c) | Alu. Cu (ගණිතමය හා තාර්කික ඒකකය, පාලන ඒකකය) |
| 24 | මූසිකයේ Mouse බොත්තම් | (d) | ආදාන - සැකසීම - ප්‍රතිදාන |
| 25 | දත්ත ගබඩාකරන උපාංගයන් | (e) | Ctrl, Alt, 0-9 |

(2 x 25 = 50)

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපන්න.

01 (i) පරිගණකයේ කාර්යයන් තුනක් නම් කරන්න.

(ii) පරිගණකයේ සුවිශේෂතා තුනක් නම් කරන්න.

(iii) පරිගණකය භාවිතා වන අවස්ථා හතරක් නම් කරන්න.

02 (i) පරිගණක දත්ත ඇතුළත් කරන උපාංග තුනක් නම් කරන්න.

(ii) පරිගණකයේ මධ්‍යම සැකසුම් ඒකකයේ කොටස් නම්කර, කාර්යයන් කෙටියෙන් ලියන්න.

(iii) ඔබ දන්නා මෙහෙයුම් පද්ධති තුනක නම් ලියන්න.

03 (i) පරිගණක විද්‍යාගාරයක දී පිළිපැදිය යුතු ප්‍රධාන ආචාර ධර්ම තුනක් ලියන්න.


(ii) පරිගණක තිරයේ ඇති දේවල් හතරක් නම් කරන්න.

(iii) පහත දැක්වෙන්නේ පරිගණක තිරයේ දී හමුවන කවුළුවක් (Window) මාතෘකා තීරුව වේ. එහි පාලන යතුරු නම් කරන්න.


A - ......................................

B - ......................................

C - ......................................




04 (i) පහත දැක්වෙන්නේ Paint මෘදුකාංගයේ මෙවලම් වේ. ඒවායේ නම ලියන්න.



1 2 3 4

(ii) Paint මෘදුකාංගයෙන් කරගතහැකි කාර්යයන් තුනක් ලියන්න.

(iii) මූසිකය (Mouse) රූප සටහනක් ඇඳ ප්‍රධාන කොටස් නම් කරන්න.

05 (i) පරිගණකයේ දත්ත ගබඩා කළ හැකි ස්ථාන (Save location) තුන නම් කරන්න.

(ii) නව ලිපිගොනුවක් (Folder) නිර්මාණය කරන ආකාරය ලියන්න.

(iii) (Folder) ලිපිගොනුවක් හැසගැන්වීමට හෝ සංස්කරණය කිරීමේ දී කළහැකි කාර්යයන් හතරක් ලියන්න.

(10 x 5 = 50)